# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1982 අංක 34 දරන
# නලීමියා ඉස්ලාමික අධ්‍යයන ආයතන සමිතිය (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 1982 සැප්තැම්බර් මස 23 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1982 සැප්තැම්බර් 24 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

මිළ : ශත 45 යි

තැපැල් ගාස්තුව : ශත 50 යි

# 1982 අංක 34 දරන නලීමියා ඉස්ලාමික අධ්‍යයන ආයතන සමිතිය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1982 සැප්තැම්බර් මස 23 වන දින]

එල්.ඩී.—ඕ. 61/81

## නලීමියා ඉස්ලාමික අධ්‍යයන ආයතන සමිතිය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.

"සීමාසහිත නලීමියා ඉස්ලාමික අධ්‍යයන සමිතිය" යනුවෙන් හඳුන්වනු ලබන සමිතියක්, එහි සාමාජිකයන් එකඟ වූ රීතිවලට අනුකූලව එකී සමිතියට සම්බන්ධ සියලු කරුණු ඵලදායි ලෙස කර ගෙන යාමේ හා ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා මෙතෙක් කල් බේරුවල පිහිටුවා තිබූ හෙයින් ද: පූර්විකාව.

එකී සමිතිය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කරුණු සඳහා ද ඒ පරමාර්ථ හා කරුණු එකී සමිතිය විසින් මෙතෙක් කල් සාර්ථක ලෙස ඉටු කරගෙන යනු ලැබ හා ක්‍රියාත්මක කරනු ලැබ ඇති හෙයින් හා එය සංස්ථාගත කිරීම සඳහා ඉල්ලුම් කර ඇති හෙයින් ද එකී සමිතිය දැන් සංස්ථාගත කරනු ලැබීම යෝග්‍ය හා අවස්ථාවෝචිත වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1982 අංක 34 දරන නලීමියා ඉස්ලාමික අධ්‍යයන ආයතන සමිතිය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. (මෙහි මින් මතු "සමිතිය" යනුවෙන් සඳහන් කරනු ලබන) සීමාසහිත නලීමියා ඉස්ලාමික අධ්‍යයන ආයතන සමිතියේ වර්තමාන සාමාජිකයන් වන, මේ පනතේ පළමුවන උපලේඛනයේ නම් සඳහන් තැනැත්තන් සහ මෙයින් පිහිටුවනු ලබන සංස්ථාවේ සාමාජිකයන් වශයෙන් මින් මතු ඇතුළත් කර ගනු ලබන තැනැත්තන්, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන් පසු (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "නලීමියා ඉස්ලාමික අධ්‍යයන ආයතන සමිතිය" යන නාමය සහ අභිධානය යටතේ, අවිච්ඡින්න පැවැත්මක් සහිත සංස්ථාවක් බවට පත් වන්නේය. තව ද එකී නාමය යටතේ ඒ සංස්ථාව විසින් ද ඊට විරුද්ධව ද සියලු අධිකරණයන් හි දී නඩු පවරනු ලැබිය හැකි අතර, පොදු මුද්‍රාවක් තබා ගැනීමට හා පාවිච්චි කිරීමට ද තම අභිමතය පරිදි ඒ මුද්‍රාව වෙනස් කිරීමට ද සම්පූර්ණ බලය හා අධිකාරය ඇත්තේය. නලීමියා ඉස්ලාමික අධ්‍යයන ආයතන සමිතිය සංස්ථාගත කිරීම.

3. සංස්ථාවේ සාමාන්‍ය අරමුණු පහත දැක්වෙන පරිදි විය යුතුය:— සංස්ථාවේ සාමාන්‍ය අරමුණු.

(අ) දැනීම වැඩි දියුණු කිරීමත් ඉස්ලාම් ධර්මය අධ්‍යයනය කිරීම නගාලීමත් සඳහා—

(i) "ජාමියා නලීමියා" නමින් හැඳින්වෙන නිදහස් අධ්‍යාපන ආයතනයකින් ද,

(ii) "නලීමියා ඉස්ලාමික පුස්තකාලය" නමින් හැඳින්වෙන ඉස්ලාමික ආශ්‍රය සහ පර්යේෂණ පුස්තකාලයකින් ද,

ඒ 49484—12,050 (80/05)

(iii) "නලීමියා ඉස්ලාමික ප්‍රකාශන කාර්යාංශය" නමින් හැඳින්වෙන ඉස්ලාමික පොත් පත් ප්‍රකාශනයට පත් කිරීමේ කාර්යාංශයකින්, සහ

(iv) මේ ඡේදයේ සඳහන් අරමුණු හා පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය යයි පෙනී යන වෙනත් යම් සේවාවන්ගෙන් ද

සමන්විත වන "නලීමියා ඉස්ලාමික අධ්‍යයන ආයතනය" නමින් හැඳින්වෙන ආයතනයට මුදල් සැපයීම, ඒ ආයතනය පවත්වාගෙන යාම හා එය කළමනාකරණය කිරීම ;

(ආ) ඉහත සඳහන් කාර්යයන් සඳහා ඒ ආයතනයට අවශ්‍ය සෑම දෙයක්ම ඒ ආයතනය සඳහා සපයා ගැනීම ; සහ

(ඇ) ඉහත සඳහන් අරමුණු ඉටු කර ගැනීමට ආනුෂංගික හා හිත කර වෙනත් සියලු ක්‍රියා සහ දේවල් කිරීම.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

4. මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව බැංකු ගිණුම් විවෘත කිරීමේ, පවත්වාගෙන යාමේ සහ වසා දැමීමේ ද ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීමේ හෝ ලබා ගැනීමේ ද සංස්ථාවේ අරමුණු ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍යවන සේවක මණ්ඩලය සේවයට ගැනීමේ, සේවයේ නියුක්ත කර ගැනීමේ සහ සේවයෙන් පහ කිරීමේ ද බලය ඇතුළුව, සංස්ථාවේ අරමුණු හෝ ඒ අරමුණු අතුරින් යම් කිසිවක් හෝ වැඩි දියුණු කිරීම නැතහොත් නංවාලීම සඳහා අවශ්‍ය වන හෝ යෝග්‍ය වන කවර ආකාරයේ වුව ද සියලු ක්‍රියා කිරීමේ ද සියලු කරුණු ඉටු කිරීමේ සහ සියලු දේ ක්‍රියාත්මක කිරීමේ ද බලය සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

5. (1) සංස්ථාවේ සභාපති, ගරු ලේකම් සහ ගරු භාණ්ඩාගාරික ද සංස්ථාවේ තත් කාලයේ වලංගුව බලපවත්නා රීතිවලට අනුකූලව තෝරාපත් කර ගනු ලැබිය යුතු තවත් සාමාජිකයන් දොළොස් දෙනකුගෙන් ද සමන්විත වන කළමනාකාර කමිටුවක් විසින්, සංස්ථාවේ තත් කාලයේ වලංගුව බලපවත්නා රීතිවලට යටත්ව, පරිපාලන කටයුතු සඳහා එහි රීතිවලට අනුකූලව කළමනාකාර කමිටුවට වෙන් කර හා බාර දී ඇති සංස්ථාවේ කටයුතු පරිපාලනය කළ යුතු ය :

එසේ වුව ද, සභාපති ධුරය එම්. අයි. එම්. නලීම් හාජියාර් මහතා ජීවත් ව සිටින තුරු ඔහු විසින් දැරිය යුතු ය.

(2) සංස්ථාවේ සියලුම සාමාජිකයන්, සංස්ථාවේ තත් කාලයේ වලංගුව බලපවත්නා රීතිවලට යටත් විය යුතු ය.

(3) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භවන අවස්ථාවේ දී සමිතියේ කළමනාකාර කමිටුවේ ධුර දරන සාමාජිකයන් වන, මේ පනතේ දෙවන උපලේඛනයේ නම් සඳහන් ව ඇති තැනැත්තන්ගෙන් සංස්ථාවේ ප්‍රථම කළමනාකාර කමිටුව සමන්විත විය යුතුය.

සංස්ථාවේ රීති.

6. සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, සාමාජිකත්වයෙන් අස්වීම හෝ සාමාජිකත්වයෙන් නෙරපීම සම්බන්ධයෙන් ද නිලධරයන් හා කළමනාකාර කමිටුව තෝරා පත් කිරීම, ඉවත් කිරීම, ඔවුන්ගේ බලතල, හැසිරීම සහ යුතුකම් සම්බන්ධයෙන් ද සංස්ථාවේ කටයුතු කර ගෙන යාම, සංස්ථාවේ සේවකයන්ගේ හැසිරීම, යුතුකම් සහ කාර්ය සම්බන්ධයෙන් සහ සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු පිළිබඳ කළමනාකරණය සහ සංස්ථාවේ අරමුණු මුදුන් පමුණුවා ගැනීම සඳහා අවශ්‍ය වන වෙනත් දේ සම්බන්ධයෙන් ද අවශ්‍ය වන සහ මේ පනතට අනනුකූල නොවන රීති, කලින් කල වාර්ෂික මහා සභා රැස්වීමක දී හෝ තත් කාර්යය සඳහා දෙසතියක් කල් දී කැඳවනු ලබන මහා සභා රැස්වීමක දී, ඒ රැස්වීමට පැමිණ සිටින හා ඡන්දය දෙන සාමාජිකයන් අතුරින් තුනෙන් දෙකකට නො අඩු බහුතර ඡන්දයෙන් සංස්ථාව විසින් සෑදීම නීත්‍යානුකූල වන්නේ ය. එසේ සාදනු ලැබූ රීති, එවැනි ම රැස්වීමක දී, ඒ රීතිවලට අනුකූලව, වෙනස් කිරීම, ඊට අමුතුවෙන් එකතු කිරීම, ඒවා සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

සමිතිය විසින් ගෙවිය යුතු සහ සමිතියට අය විය යුතු ණය.

7. මේ පනතේ කාර්ය සඳහා, මේ පනත ක්‍රියාත්මක වන අවස්ථාවෙහි දී පවත්නා සමිතියේ සියලු ණය සහ වගකීම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවිය යුතු අතර, ඒ සමිතියට අය විය යුතු සියලු ණය සහ සමිතියට ගෙවිය යුතු සියලු දායක මුදල් හා සාමාජික මුදල් සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව තැබිය යුතු ආකාරය.

8. සංස්ථාවේ රීතිවලින් නියම කර ඇති තැනැත්තන් සංඛ්‍යාව ඉදිරියේ දී හැර, සංස්ථාවේ මුද්‍රාව කිසිදු සාධන පත්‍රයකට නොතැබිය යුතුය. ඒ තැනැත්තන් විසින් තමන් පැමිණ සිටින බවට ලකුණක් වශයෙන් එකී සාධන පත්‍රයෙහි තම නම අත්සන් කළ යුතු අතර, එම අත්සන් කිරීම, සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සනට බාහිරව විය යුතුය.

සංස්ථාව විසින් චංචල හා නිශ්චල දේපළ දැරිය හැකි බව සහ ඒවා නියෝජනය කළ හැකි බව.

9. යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක් හෝ මුදල් බැහැර කිරීමක් අනුව හෝ වෙනත් ආකාරයකින් හෝ සංස්ථාව සතු වන්නා වූ චංචල හෝ නිශ්චල කවර වුවද දේපළක් සංස්ථාවේ තත් කාලයේ වලංගුව බල පවත්නා රීතිවලට යටත්ව භාර ගැනීමටත් සතුව සිටීමටත් නීතිය අනුව හැකියාව සංස්ථාවට ඇත්තේ ය. තව ද දේපළ පාවිච්චි කිරීමේ, උකස් කිරීමේ, විකිණීමේ, බද්දට දීමේ, හුවමාරු කර ගැනීමේ හෝ අන් ආකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය සහිතව, මේ පනතේ කාර්ය සඳහා සහ සංස්ථාවේ තත් කාලයෙහි බලපවත්නා රීතිවලට යටත් ව, එහි සියලු දේපළ සංස්ථාව විසින් දැරිය යුතු ය.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**10.** මේ පනතේ සඳහන් තැනැත්තන්ගේ සහ ඔවුන් මගින්, ඔවුන්ගේ හෝ ඔවුන් යටතේ හිමිකම් පාන්නවුන්ගේ අයිතිවාසිකම් වලට හැර, ශ්‍රී ලංකා ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තන්ගේ හෝ අයිතිවාසිකම් වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවන්නේ ය.

## පළමුවන උපලේඛනය (2 වන වගන්තිය)

එම්. අයි. එම්. නලීම් හාජියාර්, සමාදාන විනිශ්චයකාර
සී. එම්. අබ්දුල් ගෆූර්, සමාදාන විනිශ්චයකාර

වෛද්‍ය යූ. එල්. එම්. බෂීර්, සමාදාන විනිශ්චයකාර
සී. එල්. එම්. අබුල් හසන්

ඒ. එච්. එම්. මුක්තාර්
එම්. එච්. එම්. හිබ්බතුල්ලා

ඒ. ආර්. එම්. සුලෙයිමාන්
ඒ. සී. ඒ. වදූද්

එම්. රාසික් යූසුෆ්
එම්. එච්. එම්. හම්සා

එම්. එස්. එම්. යාකූත්
මව්ලවි එම්. අයි. එම්. මන්සූර්

එම්. අයි. එම්. කලීල්
එස්. එම්. හාෂිම්

එම්. එච්. එම්. සුබ්හාන්
ඒ. ඒ. එම්. ෆාරූක්

ඒ. ටී. එම්. ෆයිස්
වයි. එල්. එම්. අමීද්

ඒ. අයි. එම්. අන්වර්
ඒ. ආර්. එම්. ෆාරුක්

ඒ. බී. එම්. හනීෆා
ඒ. එම්. එම්. රවූෆ්

ඒ. සී. එම්. සල්මාන්
ඒ. එම්. එම්. හනීෆි

ඒ. ඒ. එම්. මොහමඩ් කාසිම්
එම්. ආර්. එම්. හම්සා

එස්. එම්. ෆාසි
එම්. එස්. එම්. මර්සූක්

වයි. එල්. එම්. සාලි
එස්. එම්. අන්වර්

එම්. එස්. එම්. අනස්
ඒ. සී. එම්. ඒ. මස්ඌද්, සමාදාන විනිශ්චයකාර

එම්. සී. එම්. හම්සා
ඒ. ඒ. මොහමඩ් සයීද්

ඒ. ජේ. එම්. මස්ඌද්, සමාදාන විනිශ්චයකාර
ජේ. එම්. එම්. රාජී, සමාදාන විනිශ්චයකාර

ඒ. එම්. අමීන්
මව්ලවි ඒ. ඒ. එම්. මස්ඌද්
එන්. එම්. ජුනයිඩ්

ආචාර්ය එම්. ඒ. එම්. ශුක්‍රි
මව්ලවි එම්. එච්. ෂාහුල් හමීඩ්

## දෙවන උපලේඛනය (5 (3) වන වගන්තිය)

### කළමනාකාර කමිටුව

| | | |
|---|---|---|
| එම්. අයි. එම්. නලීම් හාජියාර්, සමාදාන විනිශ්චයකාර | ... | ජාවජීව සභාපති |
| සී. එල්. එම් අබුල් හසන් | ... | ගරු ලේකම් |
| ඒ. එච්. එම්. මුක්තාර් | ... | ගරු භාණ්ඩාගාරික |
| එම්. එච්. එම්. හිබතුල්ලා | ... | ගරු උප ලේකම්<br>ගරු උප භාණ්ඩාගාරික සහ කමිටු සාමාජික |
| ඒ. එම්. අමීන් | ... | කමිටුවේ සාමාජික |
| මව්ලවි ඒ. ඒ. එම්. මස්ඌද් | ... | කමිටුවේ සාමාජික |
| ඒ. සී. ඒ. වදූද් | ... | කමිටුවේ සාමාජික |
| ඒ. ඒ. මොහමඩ් සයීද් | ... | කමිටුවේ සාමාජික |
| එන්. එම්. ජුනයිඩ් | ... | කමිටුවේ සාමාජික |
| ඒ. ආර්. එම්. සුලෙයිමාන් | ... | කමිටුවේ සාමාජික |
| ආචාර්ය එම්. ඒ. එම්. ශුක්රි | ... | කමිටුවේ සාමාජික |
| මව්ලවි එම්. එච්. සාහුල් හමීඩ් | ... | කමිටුවේ සාමාජික |
| ඒ. ජේ. එම්. මස්ඌද්, සමාදාන විනිශ්චයකාර | ... | කමිටුවේ සාමාජික |
| එම්. ෆී. එම්. හම්සා | ... | කමිටුවේ සාමාජික |
| ඒ. සී. එම්. ඒ. මස්ඌද්, සමාදාන විනිශ්චයකාර | ... | කමිටුවේ සාමාජික |
| ජේ. එම්. එම්. රාජී, සමාදාන විනිශ්චයකාර | ... | කමිටුවේ සාමාජික |

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත හැම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය